තංගල්ල නගර සභාව - 2024

----

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්වාගණනය කළ මතය

තංගල්ල නගර සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරිය) 181(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2024 දෙසැම්බර් 31 දිනට තංගල්ල නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තව දුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදු වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදු වන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ පරිත්‍යාග ලෙස ලද රු.87,593 ක පුස්තකාල පොත් ප්‍රාග්ධන වියදම් හා ප්‍රාග්ධන ආධාර ලැබීම් ලෙස ගිණුම්ගත කිරීම නිසා ප්‍රාග්ධන වියදම් හා ප්‍රාග්ධන ආධාර ලැබීම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.	2024 වර්ෂය දක්වා අවසන් ගිණුම් සකස් කිරීමේ දී මූල්‍යමය නොවන ආධාර සහ පරිත්‍යාග ගිණුම්ගත කිරීම සිදු කර ඇත්තේ මෙම ආකාරයට බව.	පරිත්‍යාග ලෙස ලද පුස්තකාල පොත් වටිනාකම ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ගිණුම්ගත කළ යුතුය.
(ආ)	පුස්තකාල පරිග්‍රහණ ලේඛනය අනුව පුස්තකාල පොත් ශේෂය රු.2,836,371 ක් වූ අතර මූල්‍ය ප්‍රකාශනවල එය රු.2,346,877 ක් ලෙස දැක්වීම නිසා ශේෂ දෙක අතර රු.489,494 ක වෙනසක් නිරීක්ෂණය විය.	පුස්තකාල පරිග්‍රහණ ලේඛන අනුව පොත් වල මුද්‍රිත මිළ වටිනාකම සඳහන් වන අතර ගිණුම්ගත වටිනාකම වනුයේ පිරිවැය වටිනාකමයි. මෙම වෙනස ගැලපීමට කටයුතු කරන බව.	මූල්‍ය ප්‍රකාශනවල දක්වන ලද පිරිවැය හා පරිග්‍රහණ ලේඛනය අනුව පිරිවැය වෙනසට හේතු හඳුනාගෙන ගිණුම් තුළ නිවැරදි කිරීම් කළ යුතුය.
(ඇ)	නගර සභා පොදු වෙළඳපල ගොඩනැගිල්ලෙහි අංක 19 කඩ කාමරය සඳහා නව විදුලි සම්බන්ධතාවයක් ලබා ගැනීමේ වියදමේ හා පල්ලිකුඩාව පාර ඉඩමේ වටිනාකමේ එකතුව වූ රු.62,666 ක් ස්ථාවර වත්කම් යටතේ ප්‍රාග්ධනිතකර නොතිබුණි.	ස්ථාවර වත්කම් යටතේ ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කරන බව.	රු.62,666 ක් ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කළ යුතුය.
(ඈ)	ඉකුත් වර්ෂවල හා සමාලෝචිත වර්ෂයේ මිලදීගෙන වියදම් ලෙස සටහන් කරන ලද එකතුව රු.740,342 ක පාරිභෝගික ද්‍රව්‍ය සමාලෝචිත වර්ෂයේ අවසාන පාරිභෝගික ද්‍රව්‍ය තොගය ලෙස ගිණුම්ගත කර තිබුණි.	2022 හා 2023 වර්ෂවලදී මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාවල ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කිරීමක් ලෙස මෙය සිදු වී ඇති බව.	වැඩියෙන් ගිණුම්ගත කළ පාරිභෝගික ද්‍රව්‍ය වටිනාකම නිවැරදි කළ යුතුය.

(ඉ)	තංගල්ල බස් නැවතුම්පොළ කඩ කාමර 21 ක් සඳහා 2012 වර්ෂයේ සිට 2016 අප්‍රේල් දක්වා එකතුව රු.543,400 ක කඩකුලී බිල්කර නොතිබුණි.	සභා රැස්වීමේදි තීරණය කළ පරිදි එම කඩ කාමරවල කුලී අයනොකිරීමට ඒකමතිකව සභා සම්මත වී ඇති බව.	අඩුවෙන් ගිණුම්ගත කළ ලැබිය යුතු කඩ කුලී ආදායම රු.543,400 ක් 2025 වර්ෂයේ දී නිවැරදි කළ යුතුය.
(ඊ)	සභාව විසින් බාහිර පාර්ශවයන් වෙත පවරා තිබූ නමුත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අවසන් වී නොමැති එක් නඩුවක් හා බාහිර පාර්ශවයන් විසින් සභාව වෙත පවරා තිබූ නඩු 06ක් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදු කර නොතිබුණි.	මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කිරීමට අවශ්‍ය තොරතුරු හා හෙළිදරව් කිරීමට අවශ්‍ය ගැලපීම් ඉදිරියේ දී සිදු කරන බව.	සභාව විසින් බාහිර පාර්ශවයන් වෙත පවරනු ලැබූ නඩු හා බාහිර පාර්ශවයන් විසින් සභාව වෙත පවරනු ලැබූ නඩු සම්බන්ධයෙන් අවශ්‍ය හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශන තුළ කළ යුතුය.
(උ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විවිධ ණයගැති ශේෂය තුල ගිණුම්ගතකර තිබුණු සභාව සතු කැබ්රථයට සිදුවූ අනතුර සම්බන්ධයෙන් වූ හානිය වෙනුවෙන් ලැබිය යුතු රක්ෂණ වන්දි මුදල වූ රු.මිලියන 3.19 ක් ලබාදීම අදාළ රක්ෂණ සමාගම විසින් ප්‍රතික්ෂේපකර තිබුණද මේ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ගැලපීම් සිදුකර නොතිබුණි.	මෙම මුදල ණයගැති ශේෂයෙන් ඉවත් කිරීම සිදුනොකළ හැකි බවත් ගැටළු සහගත බැවින්, සමාලෝචිත වර්ෂයේ ණයගැති ශේෂ තුළ ගිණුම්ගත කර ඇති බව.	ලැබිය යුතු රක්ෂණ වන්දි සම්බන්ධයෙන් ගිණුම්වල ගැලපීම් සිදු කළ යුතු අතර අදාළ සිද්ධිය සටහන් මගින් විස්තරාත්මකව හෙළිදරව් කළ යුතුය.
(ඌ)	නගර සභාවේ පැරණි තානායම් භූමිය, 2021 පෙබරවාරි 08 දිනැති අංක 2214/7 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් නාගරික සංවර්ධන අධිකාරියට පවරා දී තිබියදී 2021 වර්ෂයේ සිට 2024 වර්ෂයේ මැයි දක්වා බිල්කිරීම සිදුකිරීම මත ලැබිය යුතු රු.මිලියන 4.37 ක වටිනාකම හා සමාලෝචිත වර්ෂයේ මැයි මාසය දක්වා මාස 05 සඳහා පමණක් බිල්කරන ලද සමාලෝචිත වර්ෂයට අදාල ආදායම රු.494,284 ක් සම්බන්ධයෙන් පවතින අවිනිශ්චිත තත්ත්වය සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන වල අවශ්‍ය ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.	බිල්කර ඇති හිඟ මුදල අයකර ගැනීම පිළිබඳ උපදෙස් ලබාගැනීම සඳහා පළාත් පාලන කොමසාරිස් වෙත යොමුකර ඇති බව.	රු.මිලියන 4.87 ක ලැබිය යුතු ආදායම සම්බන්ධයෙන් ගිණුම්වල ගැලපීම් හෝ අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදු කළ යුතුය.

1.6.2 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂය ආරම්භ දිනට හා අවසාන දිනට වූ රු.මිලියන 160.79 ක්වූ ජංගම නොවන වත්කම් සම්බන්ධයෙන් හිමිකම් ඔප්පු, වටිනාකම තහවුරු කරන ලේඛන හා ස්ථාවර වත්කම් ලේඛන ඉදිරිපත් නොකිරීම හේතුවෙන් සතුටුදායක පරිදි සත්‍යාපනය කිරීමට නොහැකි විය.	ස්ථාවර වත්කම් ඉදිරියේ දී තක්සේරුව සඳහා අදාල දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට කටයුතු කරමින් සිටින බව හා වෙන වෙනම ස්ථාවර වත්කම් ලේඛන නඩත්තු කිරීමට ඉදිරි කාලයේ දී කටයුතු කරනු ලබන බව.	මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන හිමිකම් ඔප්පු , වටිනාකම් තහවුරු කරන ලේඛන යනාදී සාක්ෂි ඉදිරිපත් කළ යුතු අතර මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන ස්ථාවර වත්කම් ලේඛන ඉදිරිපත් කළ යුතුය.

1.7 අනුකූල නොවීම්

1.7.1 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1946 අංක 30 දරන බදු හා තක්සේරු කරන ආඥා පනතේ 20 වගන්තිය	වරිපනම් දේපල වර්ෂ 05 කට වරක් තක්සේරුකර වරිපනම් බදු අයකළ යුතු වුවත්, එපරිදි කටයුතු නොකර 2013 වර්ෂයේ තක්සේරුව මත පදනම්ව සමාලෝචිත වර්ෂයේදීත් වරිපනම් බදු අයකිරීම නිසා තක්සේරුව කාලීනව ක්‍රියාත්මක නොවූ කාලය වර්ෂ 06 ක් විය.	ඉදිරියේදි ලැබෙන තක්සේරු වාර්තා මත වරිපනම් ගාස්තු අයකිරීමට කටයුතු කරන බව.	බදු හා තක්සේරුකරන ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව වර්ෂ 05 කට වරක් වරිපනම් දේපළ තක්සේරුකර වරිපනම් අය කළ යුතුය.
(ආ)	නගර සභා ආඥා පනතේ 74 හා 77 වගන්තිය	භූමියෙහි අයිතිය සභාව වෙත නීත්‍යානුකූලව ලබාදී තිබූ වෙළඳ පරිශ්‍රයන් තුළ අනවසරයෙන් ස්ථිර කඩ කාමර ඉදිකර කුලී මුදල්ද නොගෙවා වෙළඳාම් කටයුතු සිදු කරනු ලැබූ කඩ කාමර 13 ක් සම්බන්ධයෙන් පනතේ සඳහන් විධිවිධාන අනුව කටයුතුකර නොතිබුණි.	තාවකාලිකව හා ස්ථිරව සිදුකර ඇති ඉදිකිරීම් ඉවත් කර ඒ වෙනුවට තාවකාලික වෙළඳ කුටි සකස්කර දැනට සිටින වෙළඳුන් වෙත බදු පදනම මත ලබාදීම සඳහා ව්‍යාපෘති වාර්තාවක් සකස් කර අවශ්‍ය අනුමැතිය ලබාගැනීම සඳහා පළාත් පාලන කොමසාරිස් වෙත යොමුකර ඇති බව.	අනවසරයෙන් ඉදිකර තිබුණු කඩකාමර සම්බන්ධයෙන් පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.

(ඇ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය			
(i)	මුදල් රෙගුලාසි 371 (2)	මාණ්ඩලික නොවන නිලධාරීන් 05 දෙනෙකුට අවස්ථා 08 කදී එකතුව රු.220,990 ක් වූ අත්තිකාරම් මුදල් ලබාදී තිබුණි.	එම තත්ත්වය නිවැරදිකර ඇති අතර අත්තිකාරම් මුදල් නගර සභාවේ ලේකම් නමින් නිකුත් කරන බව.	මුදල් රෙගුලාසි සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ii)	මුදල් රෙගුලාසි 571	වටිනාකම රු. 155,215 ක්වූ වසර 02 ක් ඉක්මවූ ටෙන්ඩර් ඇප තැන්පතු ශේෂ 12 ක් නියාදනය කිරීමට කටයුතුකර නොතිබුණි.	තැන්පතු ශේෂ නිරවුල් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව.	මුදල් රෙගුලාසි සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව තැන්පතු ශේෂ නිරවුල් කළ යුතුය.
(ඈ)	2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/පපාකො/2010/01 දරණ පළාත් පාලන කොමසාරිස්ගේ (දකුණු) චක්‍රලේඛයේ 05 ඡේදය	2008 හා 2009 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් ගිවිසුම්ගත නොවී බාහිර පාර්ශවයක් විසින් භාවිතා කරනු ලබන අංක S-1 හා S-24 දරණ කඩ කාමර සම්බන්ධයෙන් විධිමත් ගිවිසුමකට එළඹීමට සභාව කටයුතු කර නොතිබුණි. S-24 දරන කඩ කාමරය සඳහා පමණක් සභාවට අහිමි වූ ආදායම රු.794,500 ක් විය.	S-01 කඩ කාමරයේ බදු ගිවිසුම වලංගුතාවය තහවුරු කර ගැනීම සඳහා නඩු පවරා ඇති අතර S-24 කඩ කාමරයේ වාස බද්ධ අවසන් කර ඇති බව.	චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව අංක S-1 හා S-24 දරන කඩකාමර සම්බන්ධයෙන් විධිමත් ගිවිසුමකට එළඹිය යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.28,829,141 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.28,954,795 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

ආදායම් ප්‍රභවය	2024 ඇස්තමේන්තු ගත ආදායම	2024 බිල් කළ ආදායම	2024 රැස් කළ ආදායම	2024 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය	2023 ඇස්තමේන් තුගත ආදායම	2023 බිල් කළ ආදායම	2023 රැස් කළ ආදායම	2023 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
වරිපනම් හා බදු	7,670,000	7,793,676	7,751,325	2,763,997	6,880,500	8,125,611	9,836,885	2,721,646
කුලී	20,493,000	20,580,384	26,741,663	6,060,086	19,647,200	19,778,392	20,392,721	12,221,365
බලපත්‍ර ගාස්තු	1,151,000	2,804,195	2,845,320	311,875	799,500	1,053,388	927,388	353,000
වෙනත් ආදායම්	15,831,000	21,128,059	21,898,320	2,641,679	14,724,400	21,636,030	19,818,708	3,411,940
එකතුව	**45,145,000**	**52,306,314**	**59,236,628**	**11,777,637**	**42,051,600**	**50,593,421**	**50,975,702**	**18,707,951**

2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වරිපනම් ඒකක 1479 කින් ලැබිය යුතු වරිපනම් රු. මිලියන 2.58 ක් හා කඩ කාමර 34 කින් ලැබිය යුතු කඩ කුලී රු.මිලියන 1.65 ක් නගර සභා ආඥා පනතේ 170 වගන්තිය ප්‍රකාරව අයකර නොතිබුණි.	වරිපනම් හා කඩ කුලී පිළිවෙළින් රු.990,132 ක් හා රු.167,890 ක් අය කරගත් බවත් ඉතිරිය කඩිනමින් අයකර ගන්නා බව.	හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය.
(ආ)	ව්‍යාපාර ඒකක 105 කින් ලැබිය යුතු ව්‍යාපාර බදු හා කර්මාන්ත ඒකක 11 කින් ලැබිය යුතු එකතුව රු.289,840 ක් 2023 දෙසැම්බර් 22 දිනැති අංක 2364 දරණ ගැසට් නිවේදනය පරිදි 2024 මාර්තු 31 දිනට ප්‍රථමව අයකළ යුතු වුවත්, එම අයකිරීම් සිදුකර නොතිබුණි.	කපාහැරීමට අවශ්‍ය තීරණ ගැනීම සඳහා ඉදිරි සභාවට යොමු කිරීමට කටයුතු කරමින් සිටින බව.	හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය.
(ඇ)	සභාව සතු අංක 32 දරණ කඩකාමරය 1994 මැයි 19 දින සිට බදුගත් බදුකරු විසින් එම ස්ථානයේ අනවසරයෙන් දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකර ආපනශාලාවක් පවත්වා ගෙනයනු ලැබුවද ඒ සම්බන්ධයෙන් නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීම සහ රු.41,085 ක් වූ ලැබිය යුතු කඩකුලී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	අනවසර ඉදිකිරීම සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව උපදේශයන් හා නිර්දේශයන් ලබාදෙන ලෙස හම්බන්තොට නාගරික සංවර්ධන අධිකාරියේ නියෝජ්‍ය අධ්‍යක්ෂක මඟින් විමසීම් කළ බව.	අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම හා සභාව සතු දේපළ ආරක්ෂා කර ගැනීමට නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගත යුතුය.

(ඈ)	2008 සිට 2023 වර්ෂයේ මාර්තු 18 දක්වා නගර සභාවේ සභිකයෙකු ලෙස කටයුතු කළ පුද්ගලයෙකු විසින් සභාවට අයත් බස් නැවතුම්පොළ අංක S-01 දරණ කඩ කාමරයේ බදුකරු වශයෙන් පෙනීසිටීම නගර සභා ආඥා පනතේ 227(1) වගන්තියට අනුකූල නොවන බවත්, එම කාල සීමාව වෙනුවෙන් ඔහුට ගෙවන ලද එකතුව රු.මිලියන 1.86 ක් වූ සභික දීමනාවල වටිනාකම සහ එම කඩ කාමර වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානය වන තෙක් සභාවට ලැබිය යුතු කඩකුලී හා දඩ මුදල් රු.මිලියන 1.01 ක් අයකර කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	සභික දීමනා නැවත සභා අරමුදලට බැර කරන ලෙස දැනුම් දී ඇති අතර විභාග වෙමින් පවතින S-01 කඩ කාමරයේ බදු අයිතිය සම්බන්ධ නඩු කටයුතුවලට බාධාවන බව ලිඛිතව දැනුම් දී ඇති අතර නඩු තීන්දුව ලද පසු අයකර ගැනීම් සිදු කරන බව.	හිඟ ආදායම් සහ සභික දීමනා කඩිනමින් අයකරගත යුතුය.
(ඉ)	සභාව සතු ජනතා පොළ බදු දීමෙන් හා තානායම බදු දීමෙන් ලැබිය යුතු එකතුව රු.මිලියන 5.47 ක් මේ දක්වා අයකර ගෙන නොතිබුණි.	ජනතා පොළ බදු දීමේ කුලී අයකර ගැනීමට නඩු තීන්දුව අනුව වාරික වශයෙන් මෙම මුදල ගෙවීමට අවස්ථාව ලබාදී ඇති බවත් පැරණි තානායම සම්බන්ධයෙන් බිල්කර ඇති හිඟ මුදල කපාහැරීමට හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීම පිළිබඳ උපදෙස් ලබාගැනීම සඳහා පළාත් පාලන කොමසාරිස් වෙත යොමු කර ඇති බව.	හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය.
(ඊ)	ස්ථිර දැන්වීම් පුවරු ඒකක 04 කින් ලැබිය යුතු ගාස්තු රු.1,010,000 ක් අයකර ගෙන නොතිබූ අතර හිඟ හිටි ශේෂය තුළ වසර 02 ට වැඩි ශේෂය රු.360,000 ක් විය.	අදාළ ව්‍යාපාරිකයන් මෙම සේවා ගාස්තු ගෙවීම ප්‍රතික්ෂේප කර ඇත. ගාස්තු අයකර ගැනීම සඳහා නීතිමය කටයුතු කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන නොමැති බැවින්, මෙම ගාස්තු කපා හැරීම සඳහා ඉදිරි මහා සභාවට යොමු කිරීම සඳහා කටයුතු කරන බව.	හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය.
(උ)	සභාවට අයත් ගිනි හා ආපදා ඒකකයෙන් ලැබිය යුතු රු.610,265 ක් වූ ආදායම් අයකර ගැනීමට නගර සභා ආඥා පනතේ 170 අ (1) හා (2) වගන්ති ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	හිඟ මුදලින් රු. 90,050 ක මුදලක් අයකර ගැනීමට හැකියාවක් නොමැති අතර කපා හැරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට යොමුකර ඇත. ඉතිරි හිඟයෙන් රු.40,175 ක් අයකර ගෙන ඇති අතර ඉතිරි හිඟ මුදල් ගෙවන ලෙස ලිඛිතව දැනුම් දී ඇති බව.	හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය.
(ඌ)	පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු රු.මිලියන 19.25 ක් විය.	රු.මිලියන 6.2 ක මුදලක් අයකරගෙන ඇති අතර, ඉතිරි මුදල අයකර ගැනීමට දැනුවත් කිරීම් සිදුකර ඇති බව.	ප්‍රධාන ලේකම්, ආණ්ඩුකාර තුමා හා ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය සම්බන්ධීකරණය කර මේ සම්බන්ධ විධිමත් වැඩපිළිවෙලක් සකස් කළ යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 හඳුනාගත් පාඩු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සභාවේ ගිණි ආපදා කළමනාකරණ ඒකකයට අයත් රු.669,600 ක් වටිනාකම සහිත වාහනවලට අයත් භාණ්ඩ සහ සභාව විසින් පවත්වා ගෙන යනු ලබන පෙර පාසලෙහි පැවති වටිනාකම රු.133,400 ක් වූ මල්ටිමීඩියා ප්‍රොජෙක්ටර් යන්ත්‍රය හා ප්‍රොජෙක්ටර් ස්ක්‍රීනය යන භාණ්ඩ ඌනතාව සම්බන්ධයෙන් භාණ්ඩ සමීක්ෂණය මගින් පෙන්වා දී පිළිවෙලින් වසර 10ක් සහ වසර 09 ක කාලයක් ගත වී තිබුණද සභාවට සිදුවී තිබූ පාඩුව, වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගෙන නොතිබුණි.	තංගල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා ඇති අතර විසඳුම් ලබාදුන් පසු ඌණතා අය කර ගැනීම සිදු කරනු ලබන බව.	සභාවට සිදු වූ පාඩුව වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකර ගත යුතුය.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සභාව විසින් අනුමත කර තිබූ ගොඩනැගිලි සැලසුම් 03 කට අදාළව ආවරණ අනුමැතිය ලබා දීමේ ගාස්තු, පෙරසැරි ගාස්තු, අනුකූලතා සහතික ගාස්තු ලෙස එකතුව රු.548,991 ක් අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි. ඉදිකිරීම නිමකර අනුකූලතා සහතික ලබා නොගෙන ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යනු ලබන ගොඩනැගිලි 03 ක් සම්බන්ධයෙන් නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	සැලසුම් වලට පරිබාහිරව ඉදිකර ඇති කොටස් සඳහා නීත්‍යානුකූල අනුමැතියක් ලබා ගන්නා ලෙස දැනුම් දී ඇත. ඉන් අනතුරුව අනුකූලතා සහතිකය ලබා ගන්නා ලෙසද දන්වා සැලසුම් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව නියමිත ගාස්තුව අයකර ගැනීමට කටයුතු කරනු ලබන බව.	ආවරණ අනුමැති ලබා දීමේ ගාස්තු,පෙරසැරි ගාස්තු, අනුකූලතා සහතික ගාස්තු ලෙස අයකළ යුතු ගාස්තු කඩිනමින් අයකර ගැනීම හා මේ සම්බන්ධයෙන් ගත යුතු නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2022 ජනවාරි 27 දිනැති අංක 2264/18 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මගින් 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනතට කරනු ලැබූ සංශෝධන අනුව සමාලෝචිත වර්ෂයේදී පරිසර බලපත්‍ර ලබාගත යුතු කර්මාන්ත 13 ක් සඳහා කර්මාන්තකරුවන් උනන්දු කරවීමට හා පරිසර බලපත්‍ර ලබාදීමට සභාව කටයුතු නොකිරීම මත ලැබිය යුතු රු.64,350 ක පරිසර බලපත්‍ර ගාස්තු ආදායම් අයකර ගෙන නොතිබුණි.	සමාලෝචිත වර්ෂයේ පරිසර බලපත්‍ර ලබාදිය යුතු කර්මාන්ත වෙත පරිසර බලපත්‍ර ලබාදීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කරමින් පවතින බව.	පරිසර බලපත්‍ර ලබාගැනීම සඳහා ව්‍යාපාර උනන්දු කළ යුතුය.

3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
පට්ටියපොළ කසල කලමනාකරණ මධ්‍යස්ථානයේ කසල අට්ටි ගැසීමේ කටයුතු සඳහා 2020 වර්ෂයේ රු.මිලියන 1.55 ක් වැයකර විවෘත අංගනයක් ඉදිකිරීම ආරම්භකර තිබුණද එම කාර්ය අතරමඟ නවතා දමා තිබූ බැවින් ඒ සඳහා වැයකරන ලද මුදල නිෂ්කාර්ය වියදමක් වී තිබුණි.	වාර්ෂිකව පළාත් නිශ්චිත ප්‍රතිපාදන ඉල්ලුම් කලද ඒ සඳහා ප්‍රතිපාදන මේ වන විටත් ලැබී නොමැති බැවින් ඉදිකිරීම් කටයුතු අතරමග නැවතී ඇති අතර මෙම වසරේ ඒ සඳහා ප්‍රතිපාදන ඉල්ලුම්කර ඇති බව.	කාර්යයන් සැලසුම් කිරීමේ දී පවතින සම්පත් හා අරමුදල් කෙරෙහි අවධානය යොමුකර සැලසුම් කළ යුතුය.

3.5 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	නගර සභාව විසින් භුක්ති විඳින ඉඩම් හා ගොඩනැගිලි එකතුව රු.මිලියන 11.09 ක් වූ හා ප්‍රමාණය අක්කර 10 රූඩ් 0.5 පර්චස් 13.16 ක් වූ ඉඩම් 15 ක නීත්‍යානුකූල අයිතිය පවරා ගෙන නොතිබුණි.	විගණන නිරීක්ෂණය පිළිගන්නා බව.	වත්කම්වල නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කඩිනමින් පියවර ගත යුතුය.
(ආ)	නගර සභාව සතු ප්‍රමාණය අක්කර 3 රූඩ් 1 පර්චස් 23.66 වූ ඉඩම් 05 ක් ඵලදායී කටයුතු සඳහා යොදා ගැනීමකින් තොරව නිෂ්කාර්යව පැවතුණි.	උපයෝජනය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව.	ඉඩම් ඵලදායී කටයුතු සඳහා භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය.

3.6 ව්‍යාපෘති, කර්තව්‍යන් හෝ ප්‍රාග්ධන වැඩ ඉටු කිරීමේ ප්‍රමාදයන්

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව 2024 වර්ෂයේ සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන 1.47 ක් වූ මැදකැටිය සවුරිස් සිල්වා මාවතට සම්බන්ධ වන කාණු පද්ධතිය ඉදිකිරීමේ කර්මාන්තය ඉටු කිරීම සඳහා 2024 දෙසැම්බර් 31 දින ගිවිසුම්ගත වී ගිවිසුමෙහි කොන්දේසි අනුව දින 80 ක් තුල කර්මාන්තය නිමකර භාරදිය යුතු වුවද 2025 අප්‍රේල් 28 දින වනවිට කර්මාන්තය ඉටුකර නොතිබුණි.	සභාව විසින් ගන්නා ලද කමිටු තීරණය අනුව මෙම කර්මාන්තය තාවකාලිකව නතරකල බව	කාර්යයන් සැලසුම් කිරීමේ දී පවතින සම්පත්, අරමුදල් හා ඒ ආශ්‍රිත ස්වභාවික හා භෞතිකව පවතින බාධාවන් කෙරෙහි අවධානය යොමුකර ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය.

3.7 ප්‍රසම්පාදන කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 වගන්තියට අනුව ප්‍රසම්පාදන සැලැස්ම, ප්‍රසම්පාදන කාල සටහන් පිළියෙලකර යාවත්කාලීන කරනොතිබුණි.	2024 වර්ෂයට අදාළ ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රසම්පාදන කාලසටහන් සහිතව සකස් කර, මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ අනුමැතිය ලබාගෙන ඇති බව.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 වගන්තියට අනුව ප්‍රසම්පාදන සැලැස්ම, ප්‍රසම්පාදන කාල සටහන් පිළියෙල කළ යුතුය.
(ආ)	2024 දකුණු පළාත් සංවර්ධන සැලැස්ම යටතේ සභා ළමා ක්‍රීඩාංගනය සඳහා play station 01 මාදිලියේ උපකරණයක් මිලදී ගැනීමේදී 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.1, 6.3.6 හා 7.8 යන වගන්තිවලින් බැහැරව කටයුතු කර තිබූ අතර තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය අනුව අවම මිල වූ රු.1,555,000 නොසලකා, තාක්ෂණික ඇගයීම් කමිටු විසින් ඇගයීමට ලක්නොකරන ලද ලංසුවක් වන රු.2,475,000 ක වටිනාකමකින් යුත් play station උපකරණයක් මිලදී ගැනීමට ප්‍රසම්පාදන කමිටුව තීරණය කිරීම නිසා රු.920,000 වටිනාකම වැඩිපුර ගෙවීම් කිරීම හා ප්‍රසම්පාදන අරමුණු, නීතිරීති වලින් බැහැරව ක්‍රියාකර තිබුණි.	වඩාත් ඵලදායී හා යෝග්‍ය මෙන්ම අනුමත ප්‍රතිපාදන මඟින් උපරිම විශ්වාසය ලබා ගැනීමට හැකි උපකරණය රු.2,475,000 කට සවි කිරීමට ප්‍රසම්පාදන කමිටුව තීරණය කළ බව.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කිරීම හා මිලදී ගැනීමේ අරමුණ ඉටුවිය යුතු ආකාරයට සභාව කටයුතු කළ යුතුය.
(ඇ)	2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.2 වගන්තියට අනුව ප්‍රමාදවී ලැබෙන ලංසු විවෘත කිරීමකින් තොරව ප්‍රතික්ෂේප කිරීම සිදුකල යුතු වුවද එපරිදි කටයුතු නොකර රු.256,500 ක නිල ඇඳුම් මිලදී ගැනීමේදී ප්‍රමාද වී ලද ලංසු ඇගයීම් කර තිබුණි.	ප්‍රමාද වී පැමිණි මිල ගණන් ඇගයීමට ලක්නොකල බව	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.2 වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ඈ)	2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.9.2 වගන්තිය ප්‍රකාරව වෙනත් පියවරයන් යටතේ ලංසු ඇගයීම ආරම්භ කිරීමට පෙර වැට් බදු වටිනාකම බැහැරකර ඇගයීම සිදුකළ යුතු වුවත්, සභාව විසින් රු.467,500ක් වූ ටයර් 09 ක් මිලදී ගැනීමට අදාළ ලංසු ඇගයීමේදී එපරිදි කටයුතු කර නොතිබුණි.	මෙම දෝෂ සහිත තත්වය නිවැරදි කිරීමට කටයුතු කරන බව.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව වෙනත් පියවරයන් යටතේ ලංසු ඇගයීම ආරම්භ කිරීමට පෙර වැට් බදු වටිනාකම බැහැර කර ඇගයීම් සිදු කළ යුතුය.

3.8 මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සභාවේ තනතුරු 02 කට අදාළ අතිරික්තතා 12 ක් විධිමත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් කරදෙන ලෙස ඉල්ලීම් කර ඇති බව.	සභාවේ කාර්යය මණ්ඩල අවශ්‍යතාවයන් පිළිබඳ සමාලෝචනයක් සිදු කළ යුතුය.
(ආ)	සභාවේ සේවයේ නිරත වූ ආදායම් පරීක්ෂකවරිය 2024 මැයි 22 දින සිට අනුප්‍රාප්තිකයෙකු පසුව ලබා ගැනීමේ පදනම මත සබරගමුව පළාත් රාජ්‍ය සේවයට නිදහස්කර තිබූ අතර ආදායම් පරීක්ෂක තනතුරෙහි පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු නොකර අදාල රාජකාරි ඉටුකිරීමේ වගකීම 2024 අගෝස්තු 12 දින සිට සභාවේ සෞඛ්‍ය කම්කරුවෙකු වෙත පවරා තිබුණි.	මෙම ස්ථාන මාරුව තාවකාලිකව නතරකර දෙන ලෙස හා ආදායම් පරීක්ෂකවරයෙකු තාවකාලිකව අනුයුක්ත කරන ලෙස ඉල්ලීම් කළ බව.	සභාවේ ප්‍රමුඛ කාර්යයන් සඳහා නිලධාරීන් රඳවා ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	2001 අගෝස්තු 22 දිනැති අංක 18/2001 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව විධිමත් පරිදි ස්ථාන මාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක නොවීම නිසා සභාව තුල සේවය කරනු ලබන කාර්ය මණ්ඩලය අතුරින් නිලධාරීන් 09 දෙනෙකු වසර 05 සිට 10 දක්වා කාලපරිච්ඡේදයක් එකම සේවා ස්ථානයේ සේවය කරමින් පැවතුණි.	ස්ථාන මාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක විය යුතු බව පිළිගන්නා බව.	ස්ථාන මාරු ප්‍රතිපත්තිය අනුව කටයුතු කළ යුතුය.

3.9 දූෂ්‍ය අක්‍රමිකතා

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
නගර සභාවේ දින මුද්‍රාව හා ලිපි ශීර්ෂ භාවිතා කර ගොඩනැගිලි සැලැස්මක් හා අනුකූලතා සහතිකයක් කූට ලෙස සකස් කර, බාහිර පුද්ගලයෙකුට ලබාදී තිබූ අතර මෙම කූටලේඛන සභාවේ කාර්මික නිලධාරියෙකු සම්බන්ධ වී සකස් කර අදාළ පුද්ගලයාට ලබාදී තිබූ බවට නිරීක්ෂණය වූයෙන් මේ සම්බන්ධයෙන් වර්ෂයක කාලයක් ගතවී තිබුණද විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	මෙම සිදුවීමට අදාල පළාත් පාලන දෙපාර්තමේන්තුව මඟින් මූලික විමර්ශනයක් සිදු කෙරෙමින් පවතින බව.	විධිමත් ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 වර්ෂයේ වාර්ෂික අයවැය ලේඛනය මඟින් ක්‍රියාත්මක කිරීම සඳහා අනුමත කර ගෙන තිබූ එකතු වටිනාකම රු.මිලියන 61.16 ක් වූ සංවර්ධන යෝජනා 11 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.	විමධ්‍යගත අරමුදලින් සිදු කිරීම සඳහා නියමිත වූ කර්මාන්ත 09 ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන ලැබී නොමැති බව හා සභා අරමුදල් යොදවා ක්‍රියාත්මක කිරීමට නියමිත කර්මාන්ත 02 ක් ද ඉටුනොකල බව.	ඉලක්කගත සංවර්ධන යෝජනා සැලසුම් කිරීමටත් ඒවා ක්‍රියාත්මක කිරීමටත් කටයුතු කළ යුතුය.

4.2 විගණන කමිටු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් අවම වශයෙන් කාර්තුවකට වරක් එනම් වර්ෂයකට 4 ක් වන පරිදි පැවැත්විය යුතු වුවද 2024 වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු 3 ක් පමණක් පවත්වා තිබුණි.	පැවති රාජකාරි කාර්ය බහුලතාවය මත අදාල කාර්තුවලට දින ලැබීමේ ප්‍රමාදයක් සිදුවිය. එම හේතුව මත රැස්වීම් 04 ක් පැවැත්විය යුතු වුවද රැස්වීම් 03 ක් පමණක් පැවැත්වීමට සිදුවූ බව.	කාර්තුවකට වරක් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම පැවැත්විය යුතුය.

4.3 අයවැය පාලනය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ආදායම් විෂයයන් 03 ක අහිතකර විචලනයන්ගේ එකතුව රු.මිලියන 85.62 ක් වූ අතර එය සියයට 17 සිට සියයට 91 ක් දක්වා වූ පරාසයක පැවතුණි.	ප්‍රාග්ධන ආධාර ඇස්තමේන්තු කර තිබුණ ද බලාපොරොත්තු වූ පරිදි එම ආධාර නොලැබීම හේතු වූ බව.	විචලනයන් අවම කරගත යුතු අතර ඒ සඳහා සැලසුම්කරණය විධිමත් විය යුතුය, ආදායම් රැස් කිරීම ද කාර්යක්ෂම විය යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂය තුළ වැය විෂයයන් අතර රු.මිලියන 4.75 ක් ප්‍රතිපාදන මාරුකිරීම් සිදු කර තිබූ අතර වැය විෂයයන්ට අදාළව නිවැරදිව අයවැය ප්‍රතිපාදන වෙන්කර නොගැනීම මෙම තත්ත්වයට හේතු වී තිබුණි.	වෙන් කරගත් ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ අතර ඉදිරියේදී ප්‍රතිපාදන වෙන් කිරීමේදී මෙම තත්වය අවම කර ගැනීමට කටයුතු කරන බව.	වියදම් නිවැරදිව හඳුනාගෙන අවශ්‍ය ප්‍රතිපාදන නිවැරදිව ඇස්තමේන්තු කළ යුතුය.

4.4 පාරිසරික ගැටලු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සභාවේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා මධ්‍යම පරිසර අධිකාරිය විසින් ලබාදී තිබූ පරිසර ආරක්ෂණ බලපත්‍රයේ කොන්දේසි අංක 2.2 හා 3.2 අනුව පිළිවෙලින් කොම්පෝස්ට් නිෂ්පාදනය සඳහා ගෙන එන ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ කර්මාන්තය පිහිටි භූමියේ විවෘතව ගොඩගසා නොතැබිය යුතු බව සහ කොම්පෝස්ට් කළ නොහැකි ඝන අපද්‍රව්‍ය විවෘත භූමියක බැහැරලීම සිදු නොකළ යුතු බවත් හැකිතාක් දුරට ප්‍රතිචක්‍රීකරණය කළ හැකි ද්‍රව්‍ය වෙන්කර ප්‍රතිචක්‍රීකරණය කල නොහැකි ද්‍රව්‍ය පමණක් මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශ සහිතව බිම් පිරවීම සඳහා යොදා ගැනීම කළයුතු වුවත් සභාව එපරිදි කටයුතු කර නොතිබුණි.	කාබනික පොහොර අලෙවි කිරීමෙන් පසුව හා කසළ අංගන විවෘත වේදිකාවේ දෙවන අදියර ක්‍රියාත්මක කිරීමෙන් පසු මෙම ගැටළුව විසදෙනු ඇතැයි අපේක්ෂා කරන බව.	අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙලක් සකස් කළ යුතුය.